---

නාරම්මල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013. අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නාරම්මල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). හිඟ මුද්දර ගාස්තු ලෙස රු.9,225,843 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණ ද, ලැබිය යුතු තථ්‍ය මුද්දර ගාස්තුව රු.13,838,047 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.4,612,204 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය එකී ආයතනයේ ශේෂ සනාථ කිරීම් අනුව රු.27,781,772 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.25,783,457 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.1,998,315 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). සභාවට අයත් කැබ් රථය අළුත්වැඩියාව සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතුව පැවති රු.1,500,000 ක් සමාලෝචිත වර්ෂයට අදාලව ණයගැති ලෙස හෝ ආදායම් වියදම් ගිණුමට ප්‍රදානයක් ලෙස ගිණුම් ගතකර නොතිබූ අතර, ණය හිමියන් යටතේ ගිණුම් ගතකර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.11,049,279 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,181,622 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.71,551 ක් විය.

2.2 මූල්‍ය පාලනය

ආසියානු සංවර්ධන ණය ව්‍යාපෘතිය යටතේ සභාව විසින් 2010-2011 වර්ෂ වලදී ලබාගත් රු.මිලියන 28.6 ක ණය මුදලක් මාර්ගයක් ඉදිරිකිරීමට හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීමට වැය කර තිබූ අතර ඒ සඳහා වාර්ෂිකව ණය වාරික හා පොලී ලෙස රු. ලක්ෂ 44 ක් හා යන්ත්‍ර සඳහා ඉන්ධන හා අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.3,914,259 ක් හා රු.2,425,285 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය තුල යන්ත්‍ර කුලියට දීමෙන් රු.3,160,104 ක ආදායමක් පමණක් උපයා තිබුණි. ඒ අනුව ණය වාරික හා පොලී ගෙවීම සඳහා ඒ යටතේ උත්පාදිත ආදායම ප්‍රමාණවත් නොවන තත්ත්වයක් පැන නැග තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 4,375 | 3,736 | 1,310 |
| (ii) | බදුකුලී | 15,820 | 15,820 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,690 | 1,690 | - |
| (iv) | වෙනත් ආදායම් | 39,486 | 39,486 | - |

2.3.2 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශය තුල පවතින සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් වලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව එම හෝටලයේ හෝ ආපන ශාලාවේ පිරිවැටුම මත 1% කට නොවැඩි ගාස්තුවක් අයකරගත යුතු වුවද සභාව විසින් බලප්‍රදේශය තුල එලෙස හඳුනාගත් හෝටල් 2 ක් පැවති අතර ඒ වෙනුවෙන් රු.3,000 ක ව්‍යාපාර බදු ගාස්තුවක් පමණක් අයකර තිබුණි.

2.3.3 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු

සභා බල ප්‍රදේශයේ කුළුණු 12 ක් ස්ථාපිත කර තිබුණ ද කාලානුරූපව සමීක්ෂණයක් සිදුකර සභා බල ප්‍රදේශය තුල පවතින දුරකථන සම්ප්‍රේෂණ කුළුණු හඳුනාගැනීමක් හා ඊට අදාල පෙරසැරි ගාස්තු සහ බලපත්‍ර ගාස්තු අයකිරීමක් සිදුකර නොතිබුණි.

2.3.4 වාහන නවතා තැබීමේ ගාස්තු

සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව අතුරු ව්‍යවස්ථා සම්මත කර තිබුණ ද , කාලානුරූපව සමීක්ෂණයක් කර බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචිය හෝ නැවතුම් ස්ථාන විධිමත් කිරීමක් සිදු කර නොතිබුණි. 2011 වර්ෂය අවසන් වන විට ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන 22 ක් පමණක් හඳුනාගෙන ත්‍රීරෝද රථ 65 ක් පමණ ලියාපදිංචි කර තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.971,212 ක් හා ලැබිය යුතු මුද්දර ගාසතු රු.9,225,843 ක් විය.

2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

(අ). රු.580,260 ක් වටිනා ට්‍රැක්ටරයක් වර්ෂ 5 ක පමණ කාලයක සිට නිශ්චිත කාර්යයකට නොයොදවා සභා භූමියේ ගාල්කර තිබුණි.

(ආ). සභාව විසින් 2011 වර්ෂයේදී රු.275,500 ක් වැයකර කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍ර 2 ක් මිළදී ගෙන තිබූ අතර, 2011 ඔක්තෝබර් සිට කුට්ටිගල් නිෂ්පාදනයක් සිදු කර නොතිබුණි. නැවත 2011 දෙසැම්බර් මස රු.135,000 ක් වැයකර බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍ර 2 ක් මිළදී ගෙන පැවති අතර එහි නිෂ්පාදන කටයුතු ද 2012 පෙබරවාරි සිට ඇණහිට තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). රුක් රෝපණ වැඩසටහන සඳහා රු.50,000 ක්ද සායන පැවැත්වීම සඳහා රු.50,000 ක්ද වෙන්කර තිබුණ ද, අදාල ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එමෙන්ම වැය විෂයයන් තුනක් යටතේ

අයවැය ලේඛනය අනුව රු.147,111,000 ක වියදමක් දැරීමට අපේක්ෂා කළද ඉන් වැයකර පැවතියේ සියයට 43 ක් ලෙස රු.62,866,000 ක් පමණි.

(ආ). මුලින් පැවති අලව්ව ප්‍රාදේශීය සභාව අලව්ව හා නාරම්මල ලෙස ප්‍රාදේශීය සභා දෙකක් බවට පත්කිරීමේදී 2011 මාර්තු 31 දිනට වූ රු.7,059,762 ක විශ්‍රාම වැටුප් පාරිතෝෂික අරමුදලේ ඒකාබද්ධ ශේෂයක් පැවති අතර, නිශ්චිත බෙදා හැරීමකින් තොරව අලව්ව ප්‍රාදේශීය සභාව වෙත මුළු වටිනාකමම පවරා දී තිබුණි

(ඇ). සභාවට අදාල සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි.

(ඈ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ රු.1,300,000 ක ප්‍රතිපාදන මත රු.1,570,476 ක් වැයකර 2012 අප්‍රේල් වන විට වැඩ අවසන්ව තිබූ දඹදෙනිය වොලිබෝල් ක්‍රීඩාපිටිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාල කාර්යයට භාවිතා කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව සභාව විසින් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතු එකතු කල අගය මත බද්ද (VAT) රු.913,750 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රු.196,607 ක් වුවත්, පිළිවෙලින් රු.1,595,295 ක් හා රු.284,347 ක් දේශීය ආදායම් කොමසාරිස ජනරාල් වෙත ප්‍රේෂණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලින් අතිරේකව රු.769,285 ක බදු මුදලක් ගෙවා තිබුණි.

(ඊ) ආසියානු සංවර්ධන ණය ආධාර යටතේ 2010-2012 කාල පරිච්ඡේදය තුල රු.46,307,441 ක පිරිවැයක් මත ඉදිකරන ලද දඹදෙනිය-පොතුපිටිය මාර්ගය සඳහා ගෙවීම් කිරීමේදී කර්මාන්තයට අදාල එකතු කළ අගය මත බදු මුදල ලෙස කොන්ත්‍රාත්කාර ආයතනයට ගෙවා තිබූ රු.4,080,168 ක අගය, සභාව විසින් ගෙවිය යුතු බදු මුදල ගණනය කිරීමේදී ඉඩදිය හැකි අඩුකිරීම් යටතේ හිලවු නොකිරීම හේතුවෙන් සභා අරමුදලින් රු.4,080,168 ක බදු මුදලක් අතිරේකව ගෙවීමට සිදුව තිබුණි

2.6 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභා බල ප්‍රදේශයේ එකතුවන කසල බැහැර කිරීම සඳහා සභාවට අයත් එළියාදෙණිය ඉඩමේ අක්කර 2 ක පමණ භූමියක් යොදාගෙන තිබූ අතර එය වන සතුන්ගෙන් අපවිත්‍ර වීම සිදුව තිබුණි. රු.5,627,428 ක් වැයකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණ ද මෙට්‍රික් ටොන් 10 ක පමණ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයක් කර තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය